ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන 2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
SNU5338 /ESU3138 - විශේෂිත තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.01.19 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>01 - වන කොටස</u>**

01. 'දුබලතා සහිත පුද්ගලයන්ගේ අධ්‍යාපන පනතට (IDEA) අනුව විශේෂ අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලබන ළමුන් කාණ්ඩ 13ක් ඇත.' ඉන් **පහක් (05)** සඳහන් කරන්න.

02. ගුරුවරුන් දැන සිටිය යුතු ඔටිසම් පරාසීය අක්‍රමතාව (ASD) සහිත සිසුන්ගේ ලක්ෂණ **පහක් (05)** ලැයිස්තුගත කරන්න.

03. "සුවිශේෂ ඉගෙනුම් දුබලතාවය" යන පදය උදාහරණයක් ඇසුරෙන් නිර්වචනය කරන්න

04. වෙස්ලර්ගේ බුද්ධි පරීක්ෂණ පරිමාණය (Wechsler Adult Intelligence Scale) මත පදනම් වූ බුද්ධිමය දුබලතා පරාසයන් පන්ති පහ **(05)** සහ බුද්ධිඵලය (IQ) ලකුණු පරාසය සඳහන් කරන්න.

05. මස්තිෂ්කාඝාතය ඇතිවීම සඳහා පොදු හේතු තුනක් (03) සඳහන්කර, මස්තිෂ්කාඝාතය සිසුන්ගේ චාලක කුසලතාවන්ට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමුන්ගේ දෘෂ්ටි ඌනතාව හඳුනාගැනීම සඳහා භාවිතා කරන ක්‍රම තුනක් **(03)** සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පන්ති කාමරය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SEN) සහිත සිසුන්ට උපකාර කිරීමේදී විශේෂ අධ්‍යාපන ගුරුවරයෙකුගේ ප්‍රධාන භූමිකාවන් **පහක් (05)** නම්කර ඉන් දෙකක් (02) පැහැදිලි කරන්න.

08. ඩවුන් ගේ සහ ලක්ෂණ සහිත සිසුන්ගේ පොදු ලක්ෂණ පහක් (05) සඳහන් කර ඉන් ලක්ෂණ දෙකක් **(02)** ඔවුන්ගේ අධ්‍යාපනයට බලපාන ආකාරය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)



33

## 02- කොටස

09. 'ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර ගුරුවරයෙකුට සලකා බැලිය හැකි ප්‍රධාන සාධකයක් වන්නේ සිසුන්ගේ අවධානයයි. සිසුන්ගේ චර්යා අක්‍රමතා බොහෝවිට ඔවුන්ගේ ඉගෙනුම් පරිසරයට බලපායි.'

(i.) ඌන අවධාන අධික්‍රියාකාරී අක්‍රමතාවය (ADHD) හි ප්‍රධාන ලක්ෂණ තුන **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii.) ඔබ පන්ති කාමර ගුරුවරයෙකු ලෙස ඌන අවධාන අධික්‍රියාකාරී අක්‍රමතාවය (ADHD) සහිත සිසුන්ගේ සහ සමාන්‍ය වර්ධනයක් සහිත සිසුවෙක් වෙන්කර හඳුනාගත හැක්කේ කෙසේද යන්න උදාහරණ දෙකකින් **(02)** පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii.) ඌන අවධාන අධික්‍රියාකාරී අක්‍රමතාව (ADHD) සහිත සිසුන්ගේ චර්යා ගැටළු අවම කර ගැනීමට ඔබට භාවිතා කළ හැකි උපාය මාර්ග තුනක් **(03)** පරීක්ෂා කරන්න.

(ලකුණු 12)

10. (i.) 'කථන අක්‍රමතා' සහ 'භාෂා අක්‍රමතා' සහිත සිසුන් අතර, ඇති වෙනස්කම් උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ii.) සිසුන් අතර, දැකිය හැකි පොදු කථන අක්‍රමතා තුනක් (03) නම් කර ඒවායින් එකක් **(01)** සුදුසු උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii.) ප්‍රතිග්‍රාහක (receptive) සහ ප්‍රකාශන (expressive) භාෂා අක්‍රමතා අතර, ලක්ෂණ පහ (05) බැගින් සඳහන් කර ඉහත භාෂා අක්‍රමතා සඳහා පන්තිකාමර සහාය ලබාදීමට ක්‍රියාකාරකම් තුනක් **(03)** බැගින් නිර්මාණය කරන්න.

(ලකුණු 12)

11. (i.) සුභග සහ සහජ දක්ෂතා සහිත සිසුන් තුළ බහුලව දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පහක් **(05)** හඳුන්වන්න.

(ලකුණු 03)

(ii.) සුභග හා සහජ දක්ෂ සිසුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා පහක් (05) ලැයිස්තුගත කර එම අවශ්‍යතා සඳහා විසඳුම් සෙවීමට උපාය මාර්ග තුනක් **(03)** උදාහරණ සමඟ විස්තර කරන්න.

(ලකුණු 05)

(iii.) අන්තර්කරණ පන්ති කාමරයක සුභග හා සහජ දක්ෂ සිසුන්ට සංවර්ධනය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. ප්‍රායෝගික විසඳුම් තුනක් **(03)** උදාහරණ සමඟ යෝජනා කරන්න.

(ලකුණු 12)



3A

12. (i.) 'ඉන්ද්‍රිය ඌනතා' යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii.) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ ඉන්ද්‍රිය ඌනතා සහිත සිසුන් මුහුණ දෙන අභියෝග තුනක් **(03)** සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05)

(iii.) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ ඉන්ද්‍රිය ඌනතා සහිත සිසුන්ට ඵලදායී ලෙස සහාය වීමට ගුරුවරුන්ට භාවිතා කළ හැකි උපාය මාර්ග යෝජනා කරන්න. ඔබේ පිළිතුර නිදර්ශනය කිරීම සඳහා ප්‍රායෝගික උදාහරණ සපයන්න.
(ලකුණු 12)

13. (i.) කායික ඌනතා සහ සෞඛ්‍ය ඌනතා අතර ප්‍රධාන වෙනස්කම් සඳහන් කරන්න.
(ලකුණු 03)

(ii.) කායික හෝ සෞඛ්‍ය ඌනතා සහිත සිසුන් පාසල් පසුබිමකදී මුහුණ දිය හැකි අභියෝග තුනක් (03) පරීක්ෂා කර, එම අභියෝග ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයකට බලපාන ආකාරය පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ සපයන්න.
(ලකුණු 05)

(iii.) කායික හා සෞඛ්‍ය ඌනතා සහිත සිසුන්ට උපකාර කිරීම සඳහා ගුරුවරුන්ට අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. ඔබේ ඉහත ප්‍රතිචාරය සඳහා උපාය මාර්ග සහ ප්‍රායෝගික උදාහරණ ඇතුළත් කරන්න.
(ලකුණු 12)

14. (i.) සුවිශේෂී ඉගෙනුම් දුබලතාවයේ ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න.
(ලකුණු 03)

(ii.) පන්තිකාමර පසුබිමක සුවිශේෂී ඉගෙනුම් දුබලතා සහිත සිසුන් මුහුණ දෙන පොදු අභියෝග තුනක් (03) හඳුනා ගන්න. එම අභියෝග ඔවුන්ගේ අධ්‍යයන ප්‍රගතියට බලපාන ආකාරය පිළිබඳ උදාහරණ දක්වන්න.
(ලකුණු 05)

(iii.) අන්තර්කරණ පන්තිකාමර තුළ සුවිශේෂී ඉගෙනුම් දුබලතා සහිත සිසුන්ට උපකාර කිරීමට ගුරුවරුන්ට භාවිතා කළ හැකි උපාය මාර්ග යෝජනා කරන්න. මෙම උපාය මාර්ගවල සඵලතාවය විදහා දැක්වීමට ප්‍රායෝගික උදාහරණ ඇතුළත් කරන්න.
(ලකුණු 12)

-සියලුම හිමිකම් ඇවිරිණි.-